PDF Compressor Pro

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාධ්‍ය ඒකකයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | යොමු අංකය - | දිනය - |
| 1.2 | අමාත්‍යාංශය: අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප.) | යොමු අංකය - CM/WP/E1/2/36-1 | දිනය - 2014/10/14 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය - DMS/D/පොදු/11-2 | දිනය - 2012.12.19 |
| 1.4 | ප්‍රධාන ලේකම්(බ.ප)ගේ නිර්දේශය | යොමු අංකය - CSO/PTR/4/3/5 | දිනය - 2014/12/05 |
| 1.5 | වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය - | දිනය - |
| 1.6 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය - 1/4/2/5/122 | දිනය - 2015.04.29 |
| 1.7 | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | යොමු අංකය - 1/4/4/282 | දිනය - 2015.05.21 |

02. පත්කිරීම් බලධාරියා - මාධ්‍ය ඒකකය අයත් අමාත්‍යාංශයේ ලේකම්

ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය - ප්‍රාථමික/ අර්ධ ශිල්පීය

3.2 ශ්‍රේණි - III, II, I හා විශේෂ

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය - ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ කාර්මික නිපුණතාවයන් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් ආලෝකකරණ ශිල්පී තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම - ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04 තනතුරේ ස්වභාවය - ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත

05 වැටුප්

5.1 වැටුප් කේත අංකය - රා.පරි.චක්‍රලේඛ 6/2006(iv) අනුව PL 2-2006 A

5.2 වැටුප් පරිමාණය - රු.12,210/- 10X 130 - 10X 145-10X160-12X170-18,600/-

අනුමත කරමි / ~~නොකරමි~~

දිනය 21/5 2015.05.

PDF Compressor Pro

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 1 | 12,210/- |
| II | පියවර 12 | 13,655/- |
| I | පියවර 22 | 15,120/- |
| විශේෂ | පියවර 32 | 16,730/- |

06 සේවා ගණයට අයත් තනතුරු /තනතුර

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ආලෝකකරණ ශිල්පී | III, II , I හා විශේෂ | 1 | බස්නාහිර පළාත් මාධ්‍ය ඒකකයේ කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාමේදී මූලික අවශ්‍යතාවයක් වන ආලෝකකරණ ශිල්පී තනතුරට අයත් කාර්යයන්. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ආලෝකකරණ ශිල්පී - 01

උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණින් සියල්ලම ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් ලෙස සැලකේ .

07 බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවාගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී මෙම පරිපාටියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නියමිත සුදුසුකම් සපුරා ඇති බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවාගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවාගන්නා ශ්‍රේණිය: III

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින්



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම. (මින් විෂයන් 5 ක් එකවර සමත් වී තිබිය යුතුය.)

7.2.2.2 වෘත්තිය සුදුසුකම් : ක්ෂේත්‍රයට අදාළව N.V.Q. 2වන මට්ටමේ පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකයක් ලබා තිබීම හෝ/නොහොත් කාර්යයන්ට අදාළව රජයේ ලියාපදිංචි ආයතනයක මාස තුනකට (03) නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නැත.

7.2.2.4 කායික සුදුසුකම් : දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් : (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

(ආ) යහපත් චරිතයකින් යුක්ත අයවලුන් වීම.

(ඇ) අයදුම්පත් කැඳවන අවසන් දිනට බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ වසර තුනක ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35
(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම සීමාව බල නොපැවැත්වේ)

7.2.4 බඳවාගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නැත

7.2.4.1.1 පවත්වන බලධරයා : අදාළ නැත.

7.2.4.2 වෘත්තිය පරීක්ෂණ: අදාළ නැත

7.2.4.2.1 පවත්වන බලධරයා : අදාළ නැත

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ : අදාළ නැත
ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු අදාළ නැත

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා : අදාළ නැත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/2.32 දිනය 2015.05.21

PDF Compressor Pro

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. <u>ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද -</u><br>ක්ෂේත්‍රයේ පළපුරුද්දට එක් වර්ෂයකට ලකුණු 05 බැගින් උපරිම වසර 06 ක් සඳහා. | 30 | 50 % |
| 2. <u>ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම් -</u><br>මූලික වෘත්තීය සුදුසුකම් වලට අමතරව රජයේ පිළිගත් ආයතනයක් විසින් ක්ෂේත්‍රයට අදාළව පවත්වා ඇති මාස 6 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 10 ක් ද වසරකට වැඩි පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 20 ක් ද ලබා දෙනු ලැබේ. | 20 | |
| 3. <u>අතිරේක අධ්‍යාපන සුදුසුකම් -</u><br>අ.පො.ස.( උ.පෙළ) එක් සාමාර්ථයක් සඳහා ලකුණු 05 බැගින් උපරිම සාමාර්ථ 3ක් සඳහා. | 15 | |
| 4. <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය -</u><br>අනෙකුත් කුසලතාවයන්- උපරිම ලකුණු 30<br>පෞරුෂය - උපරිම ලකුණු 05 | 35 | |

සටහන - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත සහතික හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ කාර්යයද මෙහිදී සලකා බලනු ලැබේ. (ඇමුණුම 1 බලන්න)

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා- පත්කිරීම් බලධාරියා

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින්.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය: III

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් (06) සමත් වී තිබීම. (මින් විෂයන් 5 ක් එකවර සමත් වී තිබිය යුතුය)

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නැත

7.3.2.3 පළපුරුද්ද : තනතුරට අදාළව එක් වසරක පළපුරුද්ද

7.3.2.4 කායික සුදුසුකම් : මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්තවීම



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/282 දිනය : 2015.05.21

PDF Compressor Pro

7.3.2.5 වෙනත් : (අ) යහපත් චරිතයකින් යුක්ත අයවලුන් වීම.

(ආ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන සේවය ස්ථිර කර ඇති අයකු වීම.

(ඇ) වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

(ඈ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිම.

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව : අවුරුදු 23

7.3.3.2 උපරිම සීමාව : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් කැඳවා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

7.3.4.1 ලිඛිත විභාගය : අදාළ නැත.

7.3.4.1.1 පවත්වන බලධරයා : අදාළ නැත

7.3.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නැත.

7.3.4.2.1 පවත්වන බලධරයා : අදාළ නැත.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ : අදාළ නැත.

ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු අදාළ නැත.

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. <u>බස්නාහිර පළාත් සභාවේ ආයතනයක ස්ථිර තනතුරක ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද -</u><br>මූලික සුදුසුකම් වශයෙන් නියමිත වසරක පළපුරුද්ද හැර අතිරේක එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 3ක් සඳහා | 30 | |
| 2.<u>ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම් -</u><br>මූලික වෘත්තීය සුදුසුකම් වලට අමතරව රජයේ පිළිගත් ආයතනයක් විසින් ක්ෂේත්‍රයට අදාළව පවත්වා ඇති මාස 6 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 10 ක් ද වසරකට වැඩි පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 20 ක් ද ලබා දෙනු ලැබේ. | 20 | 50 % |
| 3. <u>අතිරේක අධ්‍යාපන සුදුසුකම් -</u><br>අ.පො.ස. ( උ.පෙළ) එක් සාමාර්ථයක් සඳහා ලකුණු 5 බැගින් උපරිම සමාර්ථ 3ක් සඳහා. | 15 | |
| 4. <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය -</u><br>ක්ෂේත්‍රයට අදාළ දැනුම හා ආකල්ප පිළිබඳ දැනුම සඳහා - උපරිම ලකුණු 30<br>පෞරුෂය - උපරිම ලකුණු 05 | 35 | |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. 144/992 දිනය 2015.05.21

PDF Compressor Pro

සටහන - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත සහතික හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ කාර්යයද මෙහිදී සලකා බලනු ලැබේ. (ඇමුණුම 02 බලන්න)

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා- පත් කිරීම් බලධාරියා

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - අභ්‍යන්තර දැන්වීම් මගින්

7.4 කුසලතා පදනම් මත බඳවා ගැනීම: කුසලතා පදනම් මත බඳවා ගැනීම සිදු නොකරයි.

08 කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර | ව්‍යුහගත පරීක්ෂණහා නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි ( ඇමුණුම 03 ) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | IIශ්‍රේණියට උසස්වී වසර තුනක් (03)ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් හා නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි. ( ඇමුණුම 04 ) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් හා නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.( ඇමුණුම 05 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම -
2 වන කාර්යක්ෂමතා කඩඉම -
3 වන කාර්යක්ෂමතා කඩඉම -
} පත්කිරීම් බලධාරියා හෝ බලය පවරන ලද ආයතනයක් මගින්.

09 භාෂා ප්‍රවීනතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| 1.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2.අනෙක් භාෂාව | රා.ප.ච. 01/2014 අනුව අදාළමට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3.සන්ධාන භාෂාව | අදාළ නැත. |

10 ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 <u>සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම</u>

10.1.1.1 <u>සපුරාලිය යුතු සුදුසුකම් -</u>

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ

PDF Compressor Pro

සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ ක්‍රියා පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස්වීම ලබන දිනට පූර්වාසන්න වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 <u>උසස්කිරීමේ ක්‍රමය</u>

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම-06) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව වසර 10ක සේවා කාලය සම්පූර්ණ වන දිනය හෝ සුදුසුකම් ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 <u>සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම</u>

10.2.1.1 <u>සපුරාලිය යුතු සුදුසුකම්</u>

(i) සේවා ගණයේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස්වීම ලබන දිනට පූර්වාසන්න වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 <u>උසස්කිරීමේ ක්‍රමය</u>

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව (ඇමුණුම-06) පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව වසර 09ක සේවා කාලය සම්පූර්ණ වන දිනය හෝ සුදුසුකම් ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම -

10.3.1 <u>සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම</u>

10.3.1.1 <u>සපුරාලිය යුතු සුදුසුකම්</u>

(i) සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/H/4/992 දිනය 2015.05.21

(ii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස්වීම ලබන දිනට පූර්වාසන්න වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 <u>උසස්කිරීමේ ක්‍රමය</u>

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව (ඇමුණුම-06) පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව වසර 09ක සේවා කාලය සම්පූර්ණ වන දිනය හෝ සුදුසුකම් ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

11 තනතුරුවලට පත්කිරීම -අදාළ නැත

11.1 සුදුසුකම් - අදාළ නැත

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

12 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි -

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලට ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

13 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ -

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිභාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14 ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය -අදාළ නැත

15 අර්ථනිරූපණ

❖ සතුටුදායක සේවා කාලය යනුවෙන් අදහස් කරනුයේ

i. පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය [illegible]

ii. සේවකයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීතයානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක්ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

❖ සක්‍රිය සේවා කාලය -

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

❖ නියමිත දිනට -

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය , නියමිත දිනය ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත.නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

16. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

සකස් කළේ - K.D.C.ය. ........ 2014/10/09
අත්සන (විෂයභාර කළමනාකරණ සහකාර)

පරීක්ෂා කළේ : ..............................

ඩී.ඇම්. ගුණසේකරබණ්ඩාර
පරිපාලන නිලධාරී
අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා
රැකිරක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය (බ.ප.)
"ශ්‍රාවස්ති මන්දිරය",
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි

දිනය 2014/10/14

අත්සන ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම
තනතුර
නිලමුද්‍රාව

එස්.එම්. සරණවිතාන

යොමු අංකය: ..............................

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙ හි මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය: 2014/10/14

අත්සන : ..............................
නම : ..............................
.............................................. අමාත්‍යාංශය
නිලමුද්‍රාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා
රැකිරක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය (බ.ප.)
"ශ්‍රාවස්ති මන්දිරය"
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
2015.05.21

PDF Compressor Pro

(12)

යොමු අංකය: CSO/PTR/4/3/5

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙහි මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2014/02/05

අත්සන :
නම :
ප්‍රධාන ලේකම් (බ.ප)

නිලමුද්‍රාව

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය: 1/4/2/5/122

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙහි මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය 2015.04.24

අත්සන :
නම :
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිලමුද්‍රාව

වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)
532/7, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ - 05.

යොමු අංකය: 1/4/4/282

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙහි මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය 2015.05.21 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය 2015.05.21

අත්සන :
නම :
ආණ්ඩුකාර ලේකම්

නිලමුද්‍රාව

සුනිල් අබේවර්ධන
බ. ප. ආණ්ඩුකාර ලේකම්



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය: 1/4/4/282 දිනය 2015.05.21

ඇමුණුම : ....01.............

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාධ්‍ය ඒකකයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණියේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

1. පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - විවෘත.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද<br>ක්ෂේත්‍රයේ පළපුරුද්දට එක් වර්ෂයකට ලකුණු 05 බැගින් උපරිම වසර 06 ක් සඳහා. | 30 | 50 % |
| 2. ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම්-<br>මූලික වෘත්තීය සුදුසුකම් වලට අමතරව රජයේ පිළිගත් ආයතනයක් (රජයේ පිළිගත් ආයතනයක් වශයෙන් රජයේ ලියාපදිංචි ආයතනයක් අදහස් කෙරේ.) විසින් ක්ෂේත්‍රයට අදාළව නිකුත් කර ඇති මාස 6 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 10 ක් ද වසරකට වැඩි පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 20 ක් ද ලබා දෙනු ලැබේ. | 20 | |
| 3. අතිරේක අධ්‍යාපන සුදුසුකම්-<br>අ.පො.ස. (උ.පෙළ) එක් සාමාර්ථයක් සඳහා ලකුණු 05 බැගින් උපරිම සාමාර්ථ 3ක් සඳහා. (ප්‍රධාන විෂයයන් පමණක් සලකා බැලේ.) | 15 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය-<br>ක්ෂේත්‍රයට අදාළ දැනුම හා අවබෝධය සඳහා -30<br>පෞරුෂය - 5 | 35 | |

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : පත්කිරීම් බලධාරියා

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ඇත.

සකස් කලේ : අත්සන : K.D.C.ය (signature)
(විෂයභාර නිලධාරියා)
නම : K.D.C.ය චන්ද්‍රසිරි
තනතුර : කළමනාකරණ සහකාර
දිනය : 2014/10/09

පරීක්ෂා කලේ : අත්සන : (signature)
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ..........
තනතුර: ..........
දිනය : 2014/10/10

ඩී.ඇම්. [illegible]
[illegible]
අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, මිනිස්බල හා රැකිරක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය (බ.ප.)
"ශ්‍රාවස්ති මන්දිරය",
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

(signature)
..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..........
තනතුර : ..........
දිනය : 2014/10/14

එස්.එච්. පරණවිතාන
[illegible]
අධ්‍යාපන, පළාත් පාලන, [illegible]
[illegible]
"ශ්‍රාවස්ති මන්දිරය"
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/1/962 දිනය : 2015.05.21

PDF Compressor Pro

ඇමුණුම : ....02..............

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාධ්‍ය ඒකකයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

1. පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - සීමිත

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බස්නාහිර පළාත් සභාවේ ආයතනයක ස්ථිර තනතුරක ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද<br>මූලික සුදුසුකම් වශයෙන් නියමිත වසරක පළපුරුද්ද හැර එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 3ක් සඳහා | 30 | 50 % |
| 2. ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම්-<br>මූලික වෘත්තීය සුදුසුකම් වලට අමතරව රජයේ පිළිගත් ආයතනයක් (රජයේ පිළිගත් ආයතනයක් වශයෙන් රජයේ ලියාපදිංචි ආයතනයක් අදහස් කෙරේ.) විසින් ක්ෂේත්‍රයට අදාළව පවත්වා ඇති මාස 6 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 10 ක් ද වසරකට වැඩි පාඨමාලාවක් හදාරා තිබේනම් ලකුණු 20 ක් ද ලබා දෙනු ලැබේ. | 20 | |
| 3. අතිරේක අධ්‍යාපන සුදුසුකම්-<br>අ.පො.ස. ( උ.පෙළ) එක් සාමාර්ථයක් සඳහා ලකුණු 05 බැගින් උපරිම සාමාර්ථ 3ක් සඳහා. ( ප්‍රධාන් විෂයයන් පමණක් සලකා බැලේ.) | 15 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය-<br>ක්ෂේත්‍රයට අදාළ දැනුම හා අවබෝධය සඳහා උපරිම ලකුණු - 30<br>පෞරුෂය - උපරිම ලකුණු 5 | 35 | |

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :පත්වීම් බලධරියා විසින් තීරණය කරනු ඇත.

සකස් කළේ : අත්සන : K.D.C.ය. Ch
(විෂයභාර නිලධාරියා)
නම : K.D.C.ය. චන්ද්‍රසිරි
තනතුර : කළමනාකරණ සහකාර
දිනය : 2014/10/09

පරීක්ෂා කළේ : අත්සන :
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම :
තනතුර:
දිනය : 2014/10/10

ඩී.ඇම්. ගුණසේකරබණ්ඩාර
පරිපාලන නිලධාරී
අධ්‍යාපන, පළාත් පාලන, ක්‍රීඩා, සංස්කෘතික හා රැකියා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය (බ.ප.)
"ශ්‍රාවස්ති මන්දිරය",
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :
තනතුර :
දිනය : 2014/10/14

එස්.එච්. පරණවිතාන
ලේකම් (වැ.බ.)
අධ්‍යාපන, පළාත් පාලන, ක්‍රීඩා, සංස්කෘතික හා රැකියා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය (බ.ප.)



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/14/282 දිනය 2015.05.21

ඇමුණුම : ....03.............

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාධ්‍ය ඒකකයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විභාග විෂය නිර්දේශය

01. පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

(අ) ව්‍යුහගත පරීක්ෂණය - වාචික පරීක්ෂණයකි.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. කාර්යාලයේ ක්‍රියාත්මක වන ධුරාවලිය, කාර්යාල සංවිධානය, කාර්යාල සංස්කෘතිය හා සාමාන්‍ය කාර්යාල ක්‍රම | 70 | 40 % |
| II. වැඩ පැමිණීම හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය<br>වැඩ - ඉතා හොඳයි -10<br>හොඳයි -05<br>පැමිනීම - ඉතා හොඳයි -10<br>හොඳයි -05<br>හැසිරීම - ඉතා හොඳයි -10<br>හොඳයි -05 | 30 | |
| මුළු ලකුණු | 100 | |

(ආ) ක්ෂේත්‍රයට අදාළ නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය - වාචික පරීක්ෂණයකි.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. තනතුරට පැවරෙන කාර්යභාරයට අදාල ප්‍රායෝගික දැනුම - ක්ෂේත්‍රයට අදාළ උපකරණ ක්‍රියාත්මක කිරීම, විදුලි සැපයුම් ලබා ගැනීම, ඒ සඳහා භාවිතා කරනු ලබන උපකරණ, ආරක්ෂිත ක්‍රමවේද පිළිබඳ දැනුම | 100 | 40% |
| මුළු ලකුණු | 100 | |

❖ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීම සඳහා ඉහත 'අ' සහ 'ආ' කොටස් වලින් එක් එක් කොටස සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

03. පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා හෝ බලය පවරන ආයතනයක් මගින්.

04. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

සකස් කලේ : අත්සන : K.D.C. ...
(විෂයභාර නිලධාරියා)
නම : K.D.C. ය. චන්ද්‍රසිරි
තනතුර : කළමනාකරණ සහකාර
දිනය : 2014/10/09

පරීක්ෂා කලේ : අත්සන : ...
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ...
තනතුර: ...
දිනය : 2014/10/10

ඩී.ඇම්. ගුණසේකර බණ්ඩාර
පරිපාලන නිලධාරී
අධ්‍යාපන, පළාත් පාලන, ...
... අමාත්‍යාංශය (බ.ප.)
"ශ්‍රාවස්ති මන්දිරය",
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

අත්සන : ...
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ...
තනතුර : ...
දිනය : 2014/10/14

එස්.එච්. සරණතිස්ස
...



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ඇමුණුම : ....04.............

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාධ්‍ය ඒකකයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

## විභාග විෂය නිර්දේශය

01. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම: බස්නාහිර පළාත් මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

(අ) ලිඛිත පරීක්ෂණය - ප්‍රශ්න 50කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. ලිඛිත පරීක්ෂණය:- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ VII, XII පරිච්ඡේද සහ කාර්යාල ක්‍රම | පැය 01 | 100 | 40% |
| **මුළු ලකුණු** | | **100** | |

(ආ) නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය - වාචික පරීක්ෂණයකි.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. මෙම තනතුරේදී ප්‍රයෝගිකව භාවිතා කරනු ලබන ශිල්පීය ක්‍රමවේද හා එම ක්‍රමවේද උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව යොදා ගැනීම පිළිබඳව දැනුම | 100 | 40% |
| **මුළු ලකුණු** | **100** | |

❖ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීම සඳහා ඉහත 'අ' සහ 'ආ' කොටස් වලින් එක් එක් කොටස සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

03. පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : පත් කිරීම් බලධාරියා හෝ බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

සකස් කළේ : අත්සන : K.D.C.ප.C.
(විෂයභාර නිලධාරියා)
නම : K.D.C.ප. [illegible]
තනතුර : [illegible]
දිනය : 2014.10.09

පරීක්ෂා කළේ : අත්සන : ..................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ..................
තනතුර : ඩී. ඇම්. ගුණසේකරබණ්ඩාර
දිනය : ..................
පරිපාලන නිලධාරි
අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, මිනි...
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..................
තනතුර : ..................
දිනය : ..................



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය [illegible] දිනය 2015.05.21

PDF Compressor Pro

ඇමුණුම : ....05..............

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාධ්‍ය ඒකකයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණියේ</u>

<u>ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා වන</u>

<u>III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

<u>විභාග විෂය නිර්දේශය</u>

01. විභාගයේ/ වෘත්තීය පරීක්ෂණයේ නම: බස්නාහිර පළාත් මාධ්‍ය ඒකකයේ ආලෝකකරණ ශිල්පී තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගයේ/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :
(අ) ලිඛිත පරීක්ෂණය - කෙටි ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ VII, VIII, XII, XIII, XVII, XLVII, XLVIII පරිච්ඡේද,<br>2. බස්නාහිර පළාත් මුල්‍ය රීති සංග්‍රහය I, II, III,IV, V, VI, VII පරිච්ඡේද | පැය 02 | 100 | 40% |
| මුළු ලකුණු | | 100 | |

(ආ) නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය - වාචික

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. මෙම තනතුරට අදාළ කාර්යභාර්ය ඉටු කිරීම හා ඒ සම්බන්ධව ලබා ඇති නිපුණතාවය හා උපයෝගී කර ගන්නා ක්‍රමවේද මැන බැලීම. | 100 | 40% |
| මුළු ලකුණු | 100 | |

❖ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීම සඳහා ඉහත 'අ' සහ 'ආ' කොටස් වලින් එක් එක් කොටස සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

03. පරීක්ෂණය පවත්වනුලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා හෝ බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

සකස්කළේ : අත්සන : K.D.C.P. C...........
(විෂයභාර නිලධාරියා)
නම : K.D.C.P. චන්ද්‍රසිරි
තනතුර : කළමනාකරණ සහකාර
දිනය : 2014.10.07

පරීක්ෂාකළේ : අත්සන : ..........
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ..........
තනතුර: ..........
දිනය : ..........

[illegible]
පරිපාලන නිලධාරී
[illegible]
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..........
තනතුර : ..........
දිනය : ..........

[illegible]
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/4/4/282 දිනය 2015.05.21

PDF Compressor Pro

ඇමුණුම : ....06.............

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාධ්‍ය ඒකකයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආලෝකකරණ ශිල්පි තනතුර සඳහා ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත

1. නිලධාරියා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................

1.2 හැඳුනුම්පත් අංකය : ..................................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..................................................................

1.4 අයත් වන සේවය හා තනතුර : ..................................................................

1.5 අයත් වන සේවා ගණය හා ශ්‍රේණිය : ..................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය : ..................................................................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..................................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩ ඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩ ඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / විශේෂ

3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.3.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? ඔව් / නැත

3.3.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ..............................................

3.3.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේද?ඔව් / නැත

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයා ගෙන තිබේ ද? ඔව් / නැත
උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද? ඔව් / නැත

3.3.5 විනය දඬුවම් ලබා තිබේ ද? ඔව් / නැත



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/44/282 දිනය : 2015.05.21

PDF Compressor Pro

4. <u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට II / I / විශේෂ ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ............................................ ....................................................................

නිලධරයාගේ අත්සන

5. <u>ආයතන ප්‍රධානිගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඉහත නම සඳහන් ............................................ ............................මහතා /මිය/මෙනවිය..........................සේවා ගණයේ ............................ ශ්‍රේණියටඋසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

දිනය : ............................................

නම : ....................................................

අත්සන : ....................................................

නිල මුද්‍රාව : ....................................................

6. <u>අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය</u>

ඉහත සඳහන් නිර්දේශයන් සැලකිල්ලට ගෙන ..........................................................................මහතා /මිය/මෙනවිය..........................සේවා ගණයේ ............................ ශ්‍රේණියට....................................දින සිට උසස් කිරීම අනුමත කරමි.

දිනය : ............................................

නම : ....................................................

අත්සන : ....................................................

නිල මුද්‍රාව : ....................................................

භාර පාණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/292 දිනය : 2015.05.21